# එස්. පියසේන මතක සටහන්



ආචාර්ය පාලිත ගනේවත්ත

**එස් පියසේන ප්‍රවීණ මාධ්‍යවේදියා අප හැර යන්නේ වැසිය නොහැකි හිඩැසක් ඉතිරි කරමින් ය. ප්‍රවීණ මාධ්‍යවේදී ආචාර්ය පාලිත ගනේවත්ත එස් පියසේන චරිතයෙන් බිඳක් මෙසේ ගෙනහැර දක්වන්නේ දැඩි කම්පාවෙනි.**

ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨතම මාධ්‍යවේදියා වූ එස්. පියසේන මහතාගේ අභාවය දැනගත් විට මට මහත් ශෝකයක් ඇතිවිය. අකාලයේ මිය නොගොස් අනූහතර වසරක් ආයු වළඳා මිය යන තෙක්ම තම දිවි දෙවෙනි කොට ප්‍රිය කළ ජනමාධ්‍ය මෙහෙවරේ නිරතවීමට එතුමන්ට වාසනාව ලද බව සිහිපත් වීම ඒ ශෝකය මදක් දුරු වීමට හේතු විය.

පාසල් අවධියේ පාසල් සඟරාවක සංස්කාරකවරයෙකු ලෙස මාධ්‍ය ජීවිතය ආරම්භ කළ පියසේන මහතා ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන්ගෙන් සිංහල උගතතේ 1939 දී වැඩි දුර ඉගෙනීම සඳහා කල්කටාවට ගියේත් 1940 දී දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ මහතාගේ කොමියුනිස්ට් පක්ෂයේ ''ජනශක්ති'' දේශපාලන පුවත්පතේ කතෘ ධූරය භාර ගත්තේත්, 1948 දී දිනමිණ කතු මඬුල්ලට බැඳුනේත් 1956 දී පාර්ලිමේන්තුවේ පළමුවන සිංහල කතා පරිවර්තකයා වූයේත් මා ඉපදෙන්නට පෙරය.

සේනාධීර පියසේන මහතා 1964 සිට 11 වසරක්ම ඉන්දියාවේ ''ආකාශ්වාහිනී'' ගුවන් විදුලි නාලිකාවේ සිංහල වැඩ සටහන් සම්පාදකවරයා ලෙස ආකාශ්වානි යේ මුල්ම බෞද්ධ වැඩ සටහන ඉදිරිපත් කළේ මා පාසලේ කුඩා දරුවකුව සිටියදීය.

පියසේන මහතා 1976 සිට යළිත් වරක් ලේක්හවුසියේ හා ලංකාදීපයේ මාධ්‍යවේදියෙකු ලෙස කටයුතු කර ජනාධිපති ජේ.ආර්.ජයවර්ධන ගේ ප්‍රවෘත්ති ලේකම් ලෙස කටයුතු කරන අවධියේ මට විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙකු වීමි. මා පියසේන මහතා පෞද්ගලිකව හඳුනාගත්තේ 1995 වසරේ දීය. ඒ එතුමන් එස්.බී.එස්. ගුවන්විදුලි කාර්යාලයට පැමිණි දිනකය.

1994 ජනාධිපතිවරණයෙන් ලත් උද්දීපනයෙන් පියසේන මහතා මුද්‍රණයෙන් එළි දැක්වූ ''චන්ද්‍රිකා හා ශ්‍රී ලංකාවේ මැතිවරණ විප්ලවය (Handrika and the Election Revolution is Sri Lanka) නමින් ඉංග්‍රීසියෙන් පළ කළ පොත මට පිළිගැන්වූ දිනයේ දීය.

පියසේන මහතා 2007 දී පළ කළ රටවල් තුනක මාධ්‍ය සමග දසක හතක් නමැති ග්‍රන්ථයේ ලංකාවේත් ඉන්දියාවේත්, ඔස්ට්‍රේලියාවේත් ගුවන් විදුලි නාලිකා සමග පැවැති සබඳතා ගැන සිත්ගන්නා සුළු අත්දැකීම් විස්තර කරයි. ගුවන් විදුලියට දැඩි රුචිකත්වයක් දැක් වූ පියසේන මහතා මිය යන තෙක්ම එස්.බී.එස්. ගුවන් විදුලිය සමග සුහද සබඳතාවයක් පැවැත් වූයේය. 2000 වසරේ සිට 2012 වසර දක්වා එස්. පියසේන මහතා සමග විවිධ දේශපාලන කරුණු අරබයා කළ සංවාද එස්.බී.එස්. ගුවන් විදුලියේ සිංහල අංශය තුළින් විසුරුවා



**මා විස්මයට පත් කළ එක් කරුණක් නම් පියසේන මහතා තුළ තිබූ විශිෂ්ඨ ස්මරණ ශක්තියයි. 1935 රජය මුහුණ දුන් සභා මැතිවරණ වල ප්‍රතිඵල ඉලක්කම් නොවරද්දා කීමටත් 1947 න් පසු පැවති සියළුම මැතිවරණ වල ජයගත් අපේක්ෂකයන් ලබා ගත් වැඩි ඡන්ද සංඛ්‍යාත් නිවැරදිව මතකයෙන් කීමටත් එතුමාට අසම සම හැකියාවක් තිබුණේය.**

හරින්නට ලැබීම මා ලද දුර්ලභ වාසනාවක් ලෙස සළකමි. මේ කාලය ඇතුලත බොහෝ සෙනසුරාදාවල මට පළමුවෙන්ම ලැබෙන දුරකථන ඇමතුම පියසේන මහතාගෙනි. ඕස්ට්‍රේලියාවේ හෝ ශ්‍රී ලංකාවේ හෝ ලෝකයේ ඕනෑම රටක දේශපාලන සිදුවීමක් ලෙස විචාරාක්ෂිය යොදවා ඉතා තර්කානුකූල ස්වාධීන මතයක් ඉදිරිපත් කිරීමට එතුමන්ට අසම සම හැකියාවක් තිබුණෝය. පියසේන මහතා සමග පැවැත් වූ සංවාදයක් ඉදිරිපත් කරන දිනක ඉරිදා මධ්‍යහනයේ වැඩ සටහන නිමාකර ගුවන් විදුලි මැදිරියේ සිට උඩු මහලේ කාර්යාලයට පැමිණි වහාම දුරකථනය නාද වන්නට පටන් ගනී. නැත්නම් දුරකථනයේ පණිවුඩ කිහිපයක් ඇත. ඒ ඇමතුම් වලින් අසන්නන් විමසන්නේ පියසේන මහතා ඔතන ඉන්නවද ? මට එතුමා සමග කතා කරන්නට පුළුවන්ද ? එතුමා කියපු අර කාරණය පිළිබඳ මට එකඟ වෙන්නට බැහැ. ආදී තොරතුරුය. පියසේන මහතා සමග පැවති සංවාදය අසන්නන් තුළ කොතරම් උනන්දුවක් ජනිත කළේද යන්නට මේ සිදුවීම කදිම සාක්ෂියකි.

මා විස්මයට පත් කළ එක් කරුණක් නම් පියසේන මහතා තුළ තිබූ විශිෂ්ඨ ස්මරණ ශක්තියයි. 1935 රජය මුහුණ දුන් සභා මැතිවරණ වල ප්‍රතිඵල ඉලක්කම් නොවරද්දා කීමටත් 1947 න් පසු පැවති සියළුම මැතිවරණ වල ජයගත් අපේක්ෂකයන් ලබා ගත් වැඩි ඡන්ද සංඛ්‍යාත් නිවැරදිව මතකයෙන් කීමටත් එතුමාට අසම සම හැකියාවක් තිබුණෝය.

මියගිය එස්. පියසේන මහතාගේ වෘත්තීය ජීවිතයෙන් වත්මන් මාධ්‍ය වේදීන්ට උගත හැකි පාඩම් දෙකක් ගැන අවධානය යොමු කරන්නට කැමැත්තෙමි.

පළමු කරුණ නම් මාධ්‍යවේදියෙකු තුළ තිබිය යුතු නිර්ව්‍යාජත්වය අවංක බව හා එඩිතර භාවයයි. අදාල දේශපාලන සමාජ හා ඓතිහාසික කරුණු විමසා බලන සිතට එකඟව එළඹුණු තීරණ නිර්භයව හෙළි දරව් කිරීමේ හැකියාවයි. පියසේන මහතා 2002 වසරේදී එළි දැක්වූ ''තට්ටු මාරුව, පවුල් වාදය විනාශය'' නමැති ග්‍රන්ථයේ ගෙවී ගිය 70 වසරක කාලයේදී තමන්ගේ ඇස් ඉදිරිපට වූ දේශපාලන සිදුවීම් විකෘති කර දැක්වීමට දරණ උත්සාහය පිළිබඳව නිර්භයව සාධක සහිතව කරුණු හෙළි දරව් කරයි. තමන්ගේ හෘදය සාක්ෂිය පාවා දෙමින් තම බඩ වඩා ගැනීමටත් දේශපාලකයන්ට කඬේ යමින් අරමුණු කරගත් ඇතැම් වර්තමාන මාධ්‍යවේදීන්ට පියසේන මහතාගේ මාධ්‍ය ජීවිතයෙන් උගත හැකි වැදගත් පාඩමත් එය වන්නේය.

පියසේන මහතා සිය මාධ්‍ය ජීවිතය පුරාම නිර්මාණාත්මක මාධ්‍යවේදියෙකු වයි. ජූලියා ග්ලාඩ් (Julida Guard) මැතිවරණයෙන් ජයගෙන ඉතාම සුළු බහුතරයකින් රජයක් පිහිට වු දින පියසේන මහතා මා අමතා එස්.බී.එස්. ගුවන් විදුලියෙන් අදහස් ප්‍රකාශ කරන්නට අවශ්‍ය බව කියා සිටියේය. එම ඉල්ලීමේ ප්‍රතිඵලයක් ලෙස අප ගුවන් විදුලිය ඉදිරිපත් කළ සංවාදය මා විස්මටය පත් කරන්නක් විය. ලංකාවේ කිසියම් මැතිවරණයකදී ජයග්‍රාහක පක්ෂය ලබාගත් ඡන්ද ප්‍රමාණයත් ජර්මනිය වැනි බටහිර රටක ඊට සමාන මැතිවරණ ප්‍රත්ඵලත් සංසන්ධනය කරමින් පියසේන මහතා ජූලියා ගිලාඩ් අගමැතිණියගේ ජයග්‍රහණය ගැන ඉදිරිපත් කළ දේශපාලන විමසුම ඉතා නිර්මාණශීලී දේශපාලන සංවාදයක් විය. එවන් සන්සන්දනාත්මක විමර්ෂණයක් ඉදිරිපත් කිරීමට පියසේන මහතාට හැකියාව තිබුනේ මාධ්‍ය ක්ෂේත්‍රයේදී ලද මහඟු අත්දැකීම් සම්භාරයට අමතරව එතුමන් තුළ තිබූ ක්ෂේත්‍රවල විශාරද දැනුමත් නිර්මාණාත්මක කුසලතාවත් නිසාය.

පියසේන චරිතයෙන් උගත හැකි එවන් කරුණු ගැන දැඩි අවධානය යොමු කිරීම වත්මන් මාධ්‍යවේදීන්ට මහඟු ඵල ලබා දෙනු ඇත. මිය ගිය පියෙසේන ශූරීන්ට අපට දැක්විය හැකි ලොකුම උපහාරය ද එය බව මගේ හැඟීමයි.

Dias Maths
Mathematics
M. Sc Mathematics (USA)
M. Sc Computer Science
B. Sc Mathematics
Grades 6 / 7 / 8 / 9 / 10
VCE – General Maths /
Maths Methods / Specialist Maths
0431 182 632
Home visiting
keerthicnc@yahoo.com
www.facebook.com/DiasMaths

NAATI Translator
Sinhalese/English
සිංහල ඉංග්‍රීසි පරිවර්තන
(Certificates/Documents for Visa matters)
Nadie Kammallaweera
Tel: 0481 179 189
Email: nadiekammallaweera@gmail.com